EQUITY STRATEGY

First Capital Research | 18 Nov 2025

"Trim Position, Stay Selective"

Analyst:
Shahana Kanagaratnam
shahana@firstcapital.lk

First Capital
A Janashakthi Group Company

What's inside?

Executive Summary……………………………………………………………………………...03

1.0 Performance of the CSE………………………………………………………04-07

2.0 Key Drivers for Equity……………………………………………………….08-20

3.0 Market Valuations…………………………………………………………….21-29

4.0 First Capital Research Top Picks for 2025E……………………….30-31

සමස්ත සාරාංශය

සමස්ත කොටස් මිල දර්ශකය (ASPI) 23,000 ඉක්මවා යයි; වසර 18ක සාමාන්‍යය වන 12.0x (2025E ඉපැයීම් මත) ට ඉහළ අගයකින් අලෙවි වේ.

කොළඹ කොටස් වෙළඳපළේ අඛණ්ඩ මෙන් ම ශක්තිමත් වර්ධනයක් වාර්තා විය. 2025 නොවැම්බර් වන විට සමස්ත කොටස් මිල දර්ශකය 23,000 ඉක්මවා ගිය අතර, එය වසර 18ක් පුරා වාර්තා වූ සමස්ත කොටස් මිල දර්ශකයේ සාමාන්‍යය අගය වන 12.0x සැලකිය යුතු ලෙස ඉක්මවා යාමකි. ශක්තිමත් ලෙස ආයතනික ඉපයීම් වර්ධනය, ස්ථාවර පොලී අනුපාත, ව්‍යාපාරික ක්ෂේත්‍රය ආශ්‍රිත විශ්වාසය වර්ධනය වීම, උද්ධමනය පහත යාම, ප්‍රශස්ත මට්ටමේ IMF මැදිහත් වීම් සහ දේශපාලන ස්ථාවරත්වය වැනි සාධක මෙම වර්ධනයට හේතු විය.

ස්ථාවර ප්‍රතිපත්ති මගින් අභියෝගවලට ඔරොත්තු දෙන ක්‍රියාවලියක් නිර්මාණය වුව ද 2026 වසරේ වර්ධනය මන්දගාමී විය හැකි ය.

- **අඩු පොලී අනුපාත මධ්‍යයේ ආර්ථිකය ශක්තිමත් හා පුළුල් ලෙස ප්‍රසාරණය: ව්‍යාපාර ආශ්‍රිත ක්‍රියාකාරකම් වසර පුරා අභියෝගවලට සාර්ථක ව ඔරොත්තු දීමේ හැකියාවෙන් පරිපූර්ණ ව පැවතුනි. ස්ථාවර ණය පොලී අනුපාත (8.0-8.5%) සහ 2026 වසර සඳහා වන නව අයවැය ව්‍යාපෘති මගින් සහාය හේතුවෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රය 2021 මේ දක්වා වේගවත් ම වර්ධනයක් වාර්තා කිරීමට සමත් විය. කාර්මික නිමැවුම් සහ විශ්වසනීයත්වය පසුගිය වසර කිහිපය තුළ වාර්තා වූ ඉහළ ම මට්ටම් කරා ළඟා වූ අතර, පුළුල් ආර්ථික ප්‍රකෘතිමත් වීමක් සහ ශක්තිමත් ආයතනික ඉපැයීම් වාර්තා කිරීම සඳහා එය බෙහෙවින් ඉවහල් විය. අපනයන ආශ්‍රිත කර්මාන්ත සහ සංචාරක ව්‍යාපාරය, ඉහළ බාහිර ඉල්ලුමක් සහ දුර්වල මුදල් ඒකකයක් මගින් වර්ධනයක් වාර්තා කළ අතර, සංචාරකයින්ගේ පැමිණීම් 2018 වසරට පෙර පැවති මට්ටම් ඉක්මවා ගියේය.**
- **සියලු ම ක්ෂේත්‍ර ආශ්‍රිත ව වර්ධනය වන පීඩන තත්ත්ව සහ මන්දගාමී වර්ධන අපේක්ෂාව: මෑත කාලීන ව ඉහළ වර්ධනයක් වාර්තා කළ ද, 2026 වසරේ දී වර්ධනය මධ්‍යස්ථ අගයක් ගනු ඇති බව සාධක කිහිපයක් මගින් පෙන්නුම් කරයි. ශ්‍රී ලංකා රුපියල දිගින් දිගට ම දුර්වල වීම ආනයන පිරිවැය වැඩි වීමට සහ පරිභෝජනය සීමා කිරීමට හේතු විය හැකි ය. රජයේ ප්‍රාග්ධන වියදම් අයවැයෙහි සඳහන් මට්ටම්වලට වඩා අඩුවෙන් ඉදිරියට යාම නිසා එහි උත්තේජක බලපෑම සීමා විය හැකිඅතර, 2025 වසරේ ඇස්තමේන්තු ගත 5%ක ප්‍රතිශතය හා සසඳන විට මන්දගාමී ප්‍රාග්ධන කරණය සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ ක්‍රියාකාරිත්වය සමඟ ඒකාබද්ධ ව, 2026 වසරේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 3.0%-4.0% දක්වා මධ්‍යස්ථ වනු ඇතැයි අපේක්ෂා කෙරේ.**
- **ඉපැයීම් සාමාන්‍යකරණය සහ විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍ර මට්ටමේ අවස්ථා: 2025 දී ඇස්තමේන්තු ගත ආයතනික ඉපැයීම් 25% කින් තියුනු ලෙස ඉහළ ගිය අතර, 2026 වසරේ දී එම අගය 17% ක් පමණ දක්වා සාමාන්‍යකරණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත් විශේෂයෙන් ඉදිකිරීම්, සංචාරක සහ විවිධාංගීකරණය වූ අපනයන ආශ්‍රිත ව්‍යාපාර, වැනි තෝරා ගත් ක්ෂේත්‍ර ආශ්‍රිත ව අඛණ්ඩ ප්‍රතිපත්තිමය වර්ධනයක් සහ මූල්‍ය ප්‍රාග්ධනය වර්ධනය කිරීමට හැකි අවස්ථා ඇත.**

උපාය මාර්ග වෙනස් වීම : නිරාවරණය අවම කිරීම තුළින් ලාභ අත් කර ගත හැකි ය.
First Capital පර්යේෂණ වාර්තාවලට අනුව සමස්ත කොටස් මිල දර්ශකය 2026 වසරේ ඇස්තමේන්තු ගත වටිනාකම් පරාසයට වඩා ඉහළින් සහ පෙර වසරවල තක්සේරු කිරීම්වලට වඩා ඉහළ අගයකින් අලෙවි කිරීමත් සමඟ, එහි YTD අගය 43%කින් වර්ධනය වූ අතර, ඉන් පසු එම ඉහළට යාම සීමා වී ඇති බව පෙනේ. ඉහළ තක්සේරු කිරීම, නැගී එන සාර්ව පීඩන තත්ත්ව සහ වඩාත් මධ්‍යස්ථ ඉපැයීම් අපේක්ෂා සැලකිල්ලට ගෙන, FCR අගය වඩාත් ආරක්ෂිත ස්ථාවරයකට මාරු වීම නිර්දේශ කෙරෙන අතර, මඟින් කොටස් නිරාවරණය 85% දක්වා අඩු කර මූල්‍ය සංචිත 15% දක්වා ඉහළ නංවයි. 2026 වසරේ මුල් භාගයේ දී වෙළඳපොළ මධ්‍යස්ථ වශයෙන් වර්ධනය වන විට ක්‍රමයෙන් ලාභ ලබා ගැනීම නිර්දේශ කෙරේ.

.

සමස්ත කොටස් මිල දර්ශකය අඛණ්ඩ ඉදිරියට (අගෝස්තු - නොවැම්බර් 2025)

First Capital
A Janashakthi Group Company

- 2025 අගෝස්තු නිකුත් කළ අපගේ පෙර වාර්තාවේ සිට, සමස්ත කොටස් මිල දර්ශකය අඛණ්ඩ ව ඉහළ ගිය අතර, 2025 නොවැම්බර් වන විට FCR අගය ඇස්තමේන්තු ගත පරාසය වන 21,000-22,000 ඉක්මවා ගොස් 23,660 දක්වා ළඟා විය.

- මෙම තිරසාර ඉහළ යාමේ තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ ශක්තිමත් ආයතනික ඉපැයීම් වර්ධනය, අඛණ්ඩව අඩු පොලී අනුපාත සහිත පරිසරයක් නිර්මාණය වීම, උද්ධමනය අඩු වීම සහ ◌ඩ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආධාර අඛණ්ඩ ව හිමි වීම ආදී සාධක හරහා නිර්මාණය වූ සමස්ත සාර්ව ආර්ථික ස්ථාවරත්වයයි.

- පසුගිය මාසවල දක්නට ලැබුණු ධනාත්මක ප්‍රවණතාව 2025 අගෝස්තු දක්වා පැවතුණු අතර, 2025 ජූනි මාසයෙන් අවසන් වූ කාර්තුව තුළ වාර්තා වූ ශක්තිමත් ආයතනික ඉපයීම් සහ ශ්‍රී ලංකාවෙන් සිදු කරන අපනයන සඳහා එක්සත් ජනපදය විසින් පනවා තිබූ තීරුබදු අඩු කිරීම හේතුවෙන් ආයෝජකයින් ආයෝජන සඳහා යොමු වීම නිසා එම ධනාත්මක තත්ත්වය තවදුරටත් ශක්තිමත් විය.

- 2025 සැප්තැම්බර් මාසයේ දී, ආයෝජකයින්ගේ විශ්වාසය පවත්වා ගනිමින්, 7.75% ක OPR අනුපාතයක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව ගත් තීරණය මගින් වෙළඳපොළ තවදුරටත් ශක්තිමත් විය.

- විස්තීරණ අරමුදල් පහසුකම (EFF) යටතේ, සිය පස්වන සමාලෝචනයේ දී IMF විසින් කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුමක් (SLA) ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, 2025 ඔක්තෝබර් දක්වා සමස්ත කොටස් මිල දර්ශකය ඉහළ යාමේ ප්‍රවණතාව අඛණ්ඩ ව පැවතුණු අතර, එය වෙළෙඳපොළ ශුභවාදී බව සහ ප්‍රතිපත්තිවල විශ්වසනීයත්වය ශක්තිමත් කිරීමට හේතු විය.

- 2026 වසර වෙනුවෙන් ඉදිරිපත් වූ අයවැය තුළින් 2025 නොවැම්බර් දක්වා කාලය තුළ වෙළෙඳපොළ උත්තේජනය ඉහළ ගිය අතර, තෝරා ගත් අංශ ආශ්‍රිත කොටස් මිල දී ගැනීම ඉහළ යාමට හේතු වී තිබේ. සැප්තැම්බර් කාර්තුවේ ශක්තිමත් ආයතනික ඉපැයීම් ද වාර්තාගත ලෙස සමස්ත කොටස් මිල දර්ශකය ඉහළ යාමට හේතු විය.

First Capital
A Janashakthi Group Company

1.0 කොටස් සඳහා ප්‍රධාන ධාවක - සාරාංශය

සාධාරණත්වය පවත්වා ගෙන යාම සඳහා ප්‍රධාන සාධක - සාරාංශය

ව්‍යාපාර ආශ්‍රිත ක්‍රියාකාරකම් ශක්තිමත් ව පවතින අතර, ස්ථාවර පොලී අනුපාත හරහා ඉදිකිරීම් ක්ෂේත්‍රය ශක්තිමත් වර්ධනයක් පවත්වා ගෙන යාම සඳහා අඛණ්ඩව මූල්‍ය පහසුකම් සැපයීම සිදු කෙරෙයි. 2026 වසරේ ජාතික අයවැය මඟින් නව ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම මගින් ඉදිකිරීම් ක්ෂේත්‍රය අංශය ශක්තිමත් ව වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එපමණක් නොව, ස්ථාවර දේශපාලන පරිසරයක්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අඛණ්ඩ මැදිහත් වීම සමඟ එක් ව, ව්‍යාපාර ක්ෂේත්‍රය ආශ්‍රිත විශ්වසනීයත්වය ශක්තිමත් කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එය මෑත කාලීන ව වාර්තා ගත ලෙස ඉහළ ගොස් ඇත. මෙම උත්තේජනය කාර්මික ක්‍රියාකාරකම්වල ඉහළ යාමට ද හේතු වී ඇති අතර, ස්ථිර ඉල්ලුමට ප්‍රතිචාර වශයෙන් කර්මාන්තශාලාවල උපයෝගිතා අනුපාත ඉහළ ගොස් ඇත. මෙම මෑත කාලීන ඉහළ යාම් දක්නට ලැබුණ ද උද්ධමනය ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉලක්කයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පවතින අතර, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂ ව ශ්‍රී ලංකා රුපියල අඛණ්ඩව අවප්‍රමාණය වීම ආනයන වියදම් මත පීඩනයක් එක් කරමින් පාරිභෝගික ඉල්ලුම ක්‍රමයෙන් අඩු කරයි. මේ අතර, රජයේ ප්‍රාග්ධන සැලසුම් ධනාත්මක මට්ටමක පැවතුණ ද, සැබෑ ප්‍රාග්ධනය අඩු විය හැකි අතර, එය පෙර වසරවල නිරීක්ෂණය කරන ලද ප්‍රවණතාවලට අනුකූල වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, 2025 වසර සඳහා ප්‍රක්ෂේපිත ශක්තිමත් 5.0%ක වර්ධනයෙන් පසු ව, දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 3.0%-4.0% දක්වා මධ්‍යස්ථ වනු ඇතැ'යි අපේක්ෂා කෙරේ.

First Capital
A Janashakthi Group Company



2.0 වෙළෙඳපොළ තක්සේරු කිරීම

ආයතනික ඉපයීම් 2025 වසරේ දී 25% කින් සහ 2026 වසරේ දී 17% කින් ඉහළ යාමත් සමඟ...

ලැයිස්තු ගත සමාගම්වල පුනරාවර්තන ලාභ, ISB ආපසු හැරවීම් සහ LOLC වාර්තා කළ රුපියල් බිලියන 110.0 ක ලාභය මඟින් එක් වරක් ඇති වූ බලපෑම් ඉවත් කරමින්, වසරින් වසර (Year of Year) ලාභය 2025 වසරේ දී 25.0% කින් සහ 2026 වසරේ දී 16.6%කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. බැංකු සහ මූල්‍ය සේවා, පාරිභෝගික ද්‍රව්‍ය හා සිල්ලර වෙළෙඳ කටයුතු, ප්‍රාග්ධන භාණ්ඩ, ඉදිකිරීම් හා යටිතල පහසුකම් සහ අපනයන-නැඹුරු කර්මාන්ත මගින් වර්ධනය මෙහෙයවනු ඇතැයි අපේක්ෂා කෙරේ.



....සමස්ත කොටස් මිල දර්ශකය , වසර 18ක සාමාන්‍ය PER අගය ලෙස වාර්තා වූ 12.0x ඉක්මවූ අතර, එය අපගේ මූලික පුරෝකථනය වන 10.0x අගය ඉක්මවා යයි...

First Capital
A Janashakthi Group Company



YTD 43.0% ඉක්මවා යාමත් සමඟ, සමස්ත කොටස් මිල දර්ශකය වර්තමානය වන විට 12.0x (වසර 18ක් වන තෙක් වාර්තා වූ සාමාන්‍ය PER අගය) ඉක්මවා ඇත.

...සහ කලාපීය සම මට්ටමේ අනෙකුත් රටවල් හා සසඳන විට, ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටී

First Capital
A Janashakthi Group Company

කොටස් හුවමාරුව	Bloomberg Ticker	අවසන් වැසීම	වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය (ඇ.ඩො. බිලියන)	එකක්.	මිල ගණන් පොත් වටිනාකම PBV
(Colombo Stock Exchange)	CSEALL	23,461.5	27.7	12.7	1.7
(Pakistan Stock Exchange)	KSE100	160,657.5	34.9	8.8	1.4
(Vietnam Hanoi Stock Exchange Equity Index)	VHINDEX	258.2	256.4	24.4	1.5
(NIFTY 50 India)	NIFTY 50	25,879.2	5,310.0	23.9	3.5
(Thailand Stock Exchange)	SETI	1,287.4	505.2	11.68	1.2



මූලාශ්‍ර : කොළඹ කොටස් හුවමාරුව (බ්ලූම්බර්ග්), First Capital පර්යේෂණ

වසර 18ක් පුරා වාර්තා වූ වෙළෙඳපොළ සාමාන්‍ය අගය වූ PER 12.0x කරා ළඟා වෙමින් පවතී

මූලාශ්‍ර : කොළඹ කොටස් හුවමාරුව, First Capital පර්යේෂණ

සමස්ත කොටස් මිල දර්ශකය , 21,000-22,000 අතර FCR වටිනාකම් පරාසයක් තුළ 7% ක ප්‍රතිශතයකින් ගනුදෙනු කටයුතු සිදු කරයි; නිරාවරණය අඩු කළ යුතු ය

First Capital
A Janashakthi Group Company

වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වය ඉහළ මට්ටමක පවතී ද ?

වෙළෙඳපොළ ශක්තිය ආර්ථික උච්චාවචනයන් අභිබවා යයි:

සමස්ත කොටස් මිල දර්ශකයේ තිරසාර ධාවනය දර්ශකය ඇස්තමේන්තු ගත FCR වටිනාකම් පරාසය වන 21,000-22,000 ට වඩා බෙහෙවින් ඉහළ අගයක් ගන්නා අතර, එය වෙළෙඳපොළ තුළ ස්ථාවර වී ඇත. අදාළ තක්සේරු කිරීම් දිගු කාලීන ඉතිහාසය තුළ වාර්තා වූ PER අගයන් ඉක්මවා ගොස් ඇති අතර, එයින් අපේක්ෂිත ආර්ථික ප්‍රකෘතිමත් භාවයේ සාර්ථකත්වය පෙන්නුම් කරයි. විශේෂයෙන්, නවතම අයවැය යෝජනා මඟින් විශේෂයෙන් ඉදිකිරීම්, සංචාරක සහ අපනයන නැඹුරු කර්මාන්ත වැනි තෝරා ගත් අංශවල වර්ධනයට සහයෝගය ලබා දෙන අතර, ප්‍රතිපත්තිමය සහාය මධ්‍ය කාලීන වර්ධන අපේක්ෂාවන් වැඩි දියුණු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, පුළුල් සාර්ව ආර්ථික දුර්වලතා තුළින් ඉදිරි දැක්ම අවදානම් මට්ටමක පවතින අතර, ශ්‍රී ලංකා රුපියල අඛණ්ඩ ව අවප්‍රමාණය වීම ආනයන පිරිවැය ඉහළ නැංවීමට, ගෘහස්ථ වියදම් ශක්තිය සීමා කිරීමට මෙන් ම ආයතනික ආන්තික මත පීඩනය යෙදීමට ඉඩ ඇත. රජයේ ප්‍රාග්ධන වියදම් සැලසුම් කළ මට්ටමට වඩා පහළින් පැවතීම එහි මූල්‍ය උත්තේජක බලපෑම අඩු කරන අතර, මන්දගාමී ආයෝජන ක්‍රියාවලිය සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය යන සාධක එක් ව 2026 වසරේ දී දළ දේශීය නිෂ්පාදිත වර්ධනය 3.0%-4.0% දක්වා මධ්‍යස්ථ වනු ඇතැයි පුරෝකථනය කර ඇත. එමඟින් තවදුරටත් ඉපැයීම් ප්‍රසාරණය වීමේ හැකියාව සීමා වන නිසා පවතින වෙළෙඳපොළ තක්සේරුකරණයේ දී වඩාත් ප්‍රවේශම් සහගත විකල්පයක් වෙත යොමු වීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ.

දර්ශක මට්ටම් ඉහළ යාම දීර්ඝකාලීන තක්සේරු කිරීම් පෙන්නුම් කරයි: ඉහළ යන තීරු බදු සහ දේශපාලනික පීඩන තත්ත්ව නිසා අස්ථාවරත්වය අඛණ්ඩ ව පවතින අතර, දර්ශකය ශක්තිමත් ඉහළ යාමක් වාර්තා කරමින් ආසන්න වශයෙන් YTD 43.0% කින් ඉහළ ගොස් නැවත නැවතත් වාර්තාගත වර්ධනයක් වාර්තා කරනු ඇත.

ඓතිහාසික පූර්වාදර්ශයන් සමාන තක්සේරුකරණ චක්‍ර ඉස්මතු කරයි:

2010-2015 අතර පශ්චාත් යුද සමයේ දී, සමස්ත කොටස් මිල දර්ශකය 6,000-7,000 අතර සාමාන්‍ය PER 14.0x අගයකින් වෙළෙඳ කටයුතු සිදු කෙරිණි. Covid වසංගතයෙන් පසු, දර්ශකය දළ වශයෙන් 6,750 සිට 12,000 දක්වා ඉහළ ගිය අතර, පසු ව නිර්මාණය වූ ආර්ථික අර්බුදය නිසා එය 8,000 පරාසයට සහ 2022 වසරේ දී 6.X සීමාවට ඇද වැටිණි. එතැන් සිට 2024-2025 කාලය තුළ සමස්ත කොටස් මිල දර්ශකය 16,000 සිට 23,000 දක්වා ගෙන යාම, යථා තත්ත්වයට පත්වීමේ සාර්ථකත්වය අවධාරණය කරයි. කෙසේ වෙතත්, මන්දගාමී වර්ධන ගමන්‍යතාවක් සහ බොහෝ හිතකර වර්ධනයන් සමඟින් ඒ වන විටත් මිල ගණන්වල ප්‍රාග්ධනීකරණය කර ඇති සම්භාවිතාව සැලකිල්ලට ගෙන, සමස්ත කොටස් මිල දර්ශකයේ සීමිත ඉහළ යාමක් වාර්තා වන බව පෙන්නුම් කරයි. ලාභ ඉපැයීමේ උපාය මාර්ග වාර්තාගත ලෙස ඉහළ යාම මධ්‍යයේ, සමස්ත කොටස් මිල දර්ශකයේ FCR අගය 2026 වසරේ දී සැලසුම් ගත පරාසයෙන් ඔබ්බට යා හැකි අතර, ලාභාංශ වර්ධනය කර ගැනීම සඳහා සුදුසු අවස්ථා නිර්මාණය කරයි. ඉහළ තක්සේරු කිරීම්, වර්ධනය වන සාර්ව පීඩන අවස්ථා සහ වඩාත් මධ්‍යස්ථ මට්ටමේ ඉපැයීම් අපේක්ෂාවන් සැලකිල්ලට ගනිමින් FCR අගය වඩාත් ආරක්ෂිත ස්ථාවරයකට මාරු වීම නිර්දේශ කරන අතර, කොටස් නිරාවරණය 85% දක්වා අඩු කර, මුදල් හිමිකම 15% දක්වා ඉහළ නැංවිය හැකි ය. 2026 වසරේ මුල් භාගයේ දී වෙළඳපොළ මධ්‍යස්ථ වර්ධනයක් සිදු විය හැකි අතර, එහි දී ක්‍රමයෙන් ලාභ ලබා ගැනීම නිර්දේශ කෙරේ.

ප්‍රධාන ප්‍රේරක සහ අවදානම් ධනාත්මක ප්‍රේරක: 5.0% ඉක්මවන ශක්තිමත් දළ දේශීය නිෂ්පාදිත වර්ධනය, SOE ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ ප්‍රතිලාභ (විශේෂයෙන් බැංකු සහ පාරිභෝගික කොටස් සඳහා) සහ රාජ්‍ය අංශයේ වැටුප් ඉහළ යාම, ප්‍රතිපත්තිමය වැරදි පියවර හෝ පාලන පසුබෑම් සඳහා හේතු විය හැකි ය.

කොටස් කළඹ පිළිබඳ නිර්දේශය

First Capital, *මූල්‍ය තත්ත්වය 15% දක්වා වර්ධනය කරමින් කොටස් නිරාවරණය 85% දක්වා පහත හෙළයි.*

කොටස් ආයෝජන සඳහා පමණක් වෙන් කරන ලද අරමුදල් සඳහා නිර්දේශය

2025 අගෝස්තු වන විට — *පෙර*

කොටස් – 100%

මුදල් – 0%

2025 නොවැම්බර් වන විට — *දැන්*

කොටස් – 85%

මුදල් – 15%

18 නොවැම්බර් 25 – 2026 වසර තුළ කොටස් ආයෝජන සඳහා ප්‍රවේශය:

වර්තමානය වන විට සමස්ත කොටස් මිල දර්ශකයේ FCR අගය 2026 වසරේ ඉලක්කය වන 21,000-22,000 ඉක්මවා යන බැවින්, වඩාත් ආරක්ෂිත මෙන් ම ස්ථාවර විකල්පයක් වෙත මාරු වීම, කොටස් නිරාවරණය 85% දක්වා අඩු කිරීම සහ මුදල් හිමිකම 15% දක්වා ඉහළ නැංවීමට නිර්දේශ කරමු. 2026 වසරේ මුල් භාගයේ දී වෙළෙඳපොළ මධ්‍යස්ථ වර්ධනයක් වෙත ගමන් කරන විට ක්‍රමයෙන් ලාභ ලබා ගැනීම සුදුසු බව නිර්දේශ කෙරේ. කෙසේ වෙතත්, සියලු ම ආයෝජන, ඊට ආවේණික අවදානම් දරන බව සැලකිල්ලට ගැනීම ඉතා වැදගත් වන අතර, නිරන්තරයෙන් වෙනස් වන වෙළෙඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් කොටස් කළඹ පිළිබඳ නිතිපතා සමාලෝචන ඉදිරිපත් කරමු.

2026 වසර සඳහා අවධානයෙන් සිටිය යුතු අංශ

ඉදිකිරීම් ක්ෂේත්‍රය

මෑත කාලීන PMI දත්ත මගින් පිළිබිඹු වන පරිදි, පසු ගිය මාස කිහිපය තුළ ඉදිකිරීම් ක්ෂේත්‍රය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළ අතර, රජය ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා අයවැය ප්‍රතිපාදන වැඩි කිරීමත් සමඟ, ඉදිරි කාර්තුවල දී මෙම ක්ෂේත්‍රය තවත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම වර්ධනයෙන් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අදාළ ක්ෂේත්‍රය ආශ්‍රිත ආයෝජන අවස්ථා හොඳින් අස්ථානගත වී ඇත.

අපනයන පදනම් කර ගත් ව්‍යාපාර

ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණය වීම අපනයන නැඹුරු සමාගම්වලට වාසිදායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තීරු බදු වැඩි වීම හේතුවෙන් ඇඟලුම් ක්ෂේත්‍රය යම් පසුබෑමකට ලක් විය හැකි වුවද, අනෙකුත් ක්ෂේත්‍ර ආශ්‍රිත ගෝලීය ඉල්ලුම ඉහළ යාමේ සහ රුපියල අවප්‍රමාණය වීම යන සාධක ද්විත්වයේ බලපෑමෙන් ප්‍රතිලාභ ලැබීමට ඉඩ ඇත. මෙම ආර්ථික පරිසරය විවිධාංගීකරණය වූ අපනයන කළඹක් සහිත සමාගම්වලට ශක්තිමත් ලෙස ස්ථාන ගත වීම සඳහා අවස්ථා නිර්මාණය කරනු ඇත.

සංචාරක ක්ෂේත්‍රය

වර්තමානය වන විට ශ්‍රී ලංකාවට සංචාරකයින්ගේ පැමිණීම 2018 වසරේ වාර්තා වූ මට්ටම ඉක්මවා ගොස් ඇති අතර, විදේශ විනිමය උපයා දෙන මෙම ප්‍රධාන ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන යන වැඩ පිළිවෙලෙහි සාර්ථකත්වය එමගින් පිළිබිඹු කරයි. මීට අමතරව, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම තවදුරටත් ඉහළ යා හැකි අතර, ශ්‍රී ලංකාව විනෝදාස්වාදය සඳහා විශේෂිත මධ්‍යස්ථානයක් ලෙස ස්ථාන ගත කිරීම අරමුණු කරගත් ක්‍රීඩා පනත් කෙටුම්පත සම්මත කිරීමත් සමඟ, මේ වන විට ස්ථාපිත වෙළඳපොළෙන් ඔබ්බට යමින් නව සංචාරකයින් කර්ෂණය කර ගැනීමට අපේක්ෂා කෙරේ. එය නගර ආශ්‍රිත හෝටල් කර්මාන්තය සඳහා සැලකිය යුතු මට්ටමේ සහයෝගයක් ලබා දෙනු ඇත.

මූලාශ්‍ර : කොළඹ කොටස් හුවමාරුව, First Capital පර්යේෂණ

2026 වසරේ දී අවධානය යොමු කළ යුතු ප්‍රධාන අංශ

බැංකු සහ මූල්‍ය

අඛණ්ඩව අඩු පොලී අනුපාත පැවතීම සහ ශක්තිමත් ව්‍යාපාරික ක්‍රියාකාරකම් හේතුවෙන් පෞද්ගලික අංශයේ ණය අඛණ්ඩ ව වර්ධනය විය හැකි අතර, එය 2026 වසරේ දී 12% කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම හිතකර තත්ත්වය බැංකු ක්‍රියාවලිය සඳහා සහය විය යුතු වේ. වෙළෙඳ මූල්‍ය පරිමා ඉහළ යාම සහ ඩිජිටල් ගනුදෙනු පුළුල් වීම තුළින් ගාස්තු හා කොමිස් ආදායම ශක්තිමත් විය හැකි අතර, සාර්ව ආර්ථික ස්ථාවරත්වය වර්ධනය වීම නිසා දුර්වලතා හේතුවෙන් නිර්මාණය විය හැකි පීඩනය අඩු වනු ඇත. වාහන ආනයන සීමා ක්‍රමයෙන් ලිහිල් කිරීම නිසා බැංකු සහ විවිධාංගීකරණය වූ මූල්‍ය සමාගම් ලබා දෙන මූල්‍ය පහසුකම් ද ඉහළ නංවා ඇති නමුත් මෙම බලපෑම ව ඉල්ලුම අඩු වන විට මධ්‍යස්ථ විය හැකි ය. ඇතැම් සේවා සාධාරණ වටිනාකමකට ළඟා වුව ද, තෝරා ගත් සමාගම් ආකර්ශනීය ඉහළ ප්‍රතිලාභ ලබා දීම අඛණ්ඩ ව සිදු කරනු ඇත.



First Capital
A Janashakthi Group Company

3.0 2025 වසරේ ප්‍රධාන ඉලක්ක

FIRST CAPITAL 2025 TOP RECOMMENDATIONS

17-Nov-25

Stock	Stock Code	Market Price LKR	PER	PBV	DY	52-Week High LKR	52-Week Low LKR	Target Price 2025E/FY26E LKR	Target Status 2025E/FY26E LKR	Target Price 2026E/FY27E LKR	Recommendation
John Keells Holdings	JKH.N0000	22.50	73.8x	1.0x	0.6%	26.10	18.30	27.00		34.00	BUY
Commercial Bank PLC - Voting	COMB.N0000	212.75	5.2x	1.2x	1.8%	218.00	119.00	210.00	Achieved	225.00	BUY
National Development Bank PLC	NDB.N0000	151.00	5.9x	0.8x	1.3%	158.00	80.20	170.00		190.00	BUY
Seylan Bank PLC	SEYB.N0000	110.50	6.4x	0.9x	0.9%	116.00	56.20	120.00		150.00	BUY
LB Finance PLC	LFIN.N0000	162.50	7.9x	1.7x	4.9%	174.00	77.00	175.00		235.00	BUY
Commercial Credit and Finance PLC	COCR.N0000	136.25	5.9x	1.4x	2.9%	154.75	44.20	160.00		200.00	BUY
Hayleys PLC	HAYL.N0000	195.00	10.8x	1.5x	2.7%	200.00	101.50	180.00	Achieved		BUY (Under Review)
Teejay Lanka PLC	TJL.N0000	38.20	9.7x	0.9x	3.9%	59.00	37.30			42.00	SELL
Hayleys Fabric PLC	MGT.N0000	41.50	10.0x	1.5x	4.2%	57.50	36.80	50.00		54.00	HOLD (Under Review)
JAT Holdings PLC	JAT.N0000	51.00	14.6x	2.5x	1.6%	55.50	18.60	40.00	Achieved	46.00	SELL
Hemas Holdings PLC	HHL.N0000	35.70	12.8x	2.2x	2.2%	35.60	24.00	30.00		36.00	HOLD (Under Review)
Ceylon Cold Stores PLC	CCS.N0000	113.50	18.4x	4.8x	3.8%	125.00	64.10	130.00		150.00	BUY
Aitken Spence Hotel Holdings PLC	AHUN.N0000	119.75	15.0x	1.7x	0.0%	128.25	64.50	100.00	Achieved	155.00	BUY

*First Capital Research's top recommended stocks are chosen based on the potential return and the liquidity of the stocks
*HHL has been adjusted for the share sub division in the ratio 1:5
*JKH has been adjusted for the share sub division in the ratio 1:10

Thank you!

“SUCCESSFUL INVESTMENTS IS ABOUT MANAGING RISKS”

First Capital
A Janashakthi Group Company

Contact Us

First Capital Holdings PLC
No: 02, Deal Place,
Colombo 00300,
Sri Lanka.
E: research@firstcapital.lk

Dimantha Mathew
Chief Research & Strategy Officer
T: +94 11 2639 853
E: dimantha@firstcapital.lk

Charith Gamage
Vice President – Research
T: +94 11 2639 863
E: charith@firstcapital.lk

Ranjan Ranatunga
Assistant Vice President – Research
T: +94 11 2639 863
E: ranjan@firstcapital.lk

Shahana Kanagaratnam
Senior Assistant Manager – Research
T: +94 11 2639 866
E: shahana@firstcapital.lk

Akna Tennakoon
Senior Research Analyst
T: +94 11 2639 866
E: akna@firstcapital.lk

Dilhari Dias
Research Analyst
T: +94 11 2639 866
E: dilhari@firstcapital.lk

Imashi Sellapperuma
Research Analyst
T: +94 11 2639 866
E: imashi@firstcapital.lk

Manusha Kandanaarachchi
Research Associate
T: +94 11 2639 866
E: manusha@firstcapital.lk

Salaama Sanoon
Research Associate
T: +94 11 2639 866
E: salaama@firstcapital.lk